


"ඔය මොකක්ද ඔය ?" ඒ පින්සල.

"මේකට තමයි කියන්නෙ යුකුලෙලේ කියලා." පැන්සල තමන් අතේ තිබුණ සංගීත භාණ්ඩෙ හැඩ රුව බලන ගමන් ම පින්සලට උත්තර බැන්ඳා.

"කොහෙන් ද ගත්තෙ ?" ආයෙත් පින්සල.

"ඔපෝචුනිටි ෂොප් එකකින්" පරණ බඩු ඉගෙන ගන්න පුළුවන් තැනක් අන්තර්ජාලයේ හෙව්වා...."

"මේ තියෙන්නේ...." මාස හයේ කෙටි පාඨමාලා.... "හෝම්ස් ග්ලේන්" ටේෆ් එකෙයි තියෙන්නෙ. ගාන තමයි ටිකක් සැර ! බලමු."

අපේ තුන්දෙනා විටින් විට ඔය සංගීත හඬ තීරුවලට සින්දු කියන්න අපේ කට්ටිය එකතුවෙන තැන්වලට යනවා. ඒ විනෝදෙට වාගේ. නගරයේ බස්නාහිර පැත්තෙ තියෙන "මියුරු සර" ගායන එකමුතුවට ගිය වෙලාවේ මහීෂා ජයකොඩි කියන දැරිවි නනදා මාලිනී මහත්මියගේ "තරුද නිදන මහ රෑ" සින්දුව කිව්වෙ " යුකුලෙලේ" එකක් එහෙම වාදනය කරන ගමන්.

"කොහෙන්ද දුවේ ඉගෙන ගත්තේ ?" පැන් ඇහැව්වෙ බොහොම උනන්දුවෙන්.

කඩයකින් ලාබෙට ගන්න යුකුලෙලේ භාණ්ඩයට පැන්ට හරියට හිත ගිහින් වගේ......"

"ප්ලේ කරන්න පුළුවන්ද ?"

"බෑ, බෑ. ප්ලේ කරන්නම නෙවි. දැක්කා. හිත ගියා. ගත්තා..." පැන්ගේ උත්තර කෙටියි.

"ඕකනෙ වැරැද්ද..... ලාබෙට හම්බවුණ හන්දා වෙන්නැති. කේස් එකකුත් නෑ නේද ?" පින් ඇහුවේ කෙදාරොක් වෙලා වගෙයි.

"හැරිම හුරු බුහුටි භාණ්ඩෙ. මං ගත්තෙනං පෙනුමට තමයි. ඒත් දැං හිතෙනවා ප්ලේ කරන්න ඉගෙන ගන්න."

යුකුලෙලේ භාණ්ඩය ගිටාරය වගේමයි හැඩ රුවෙන් නම්. ඒත් කුඩයි. වයර් හතරයි තියෙන්නේ. පැන්සල යුකුලෙලේ භාණ්ඩය වාදනය කරන්න

"තනියම අංකල්. ඉන්ටර්නෙට් එකේ ලෙසන්ස් තියෙනවා. ෆලෝ කරන්න පුළුවන්." ඒ දුව කිව්වා.

"යුකුලෙලේ" භාණ්ඩයෙන් වාදනය කරන්න පුළුවන් රිද්මය විතරයි. එදා මහේෂා දුව වාදනය කළෙත් රිද්මයටයි. හරියට "රිදම් ගිටාර්" එකක් වගේ. ඒ රිද්මයටයි සින්දුව ගායනා කළේ.

පැන්සලට ඕන කළේ සින්දු වාදනය කරන්න. ඒ කියන්නේ සින්දුවක තාලය; නැත්නම් තනුව. පැන්ට හොඳ අදහසක් ආවා. ඉගෙන ගන්න පන්ති යන්නවත්, අන්තර්ජාලෙට යන්නවත් ඕන නෑ. වයර් හතර වයලින් එකේ වයර් හතරේ විදියට සුසර කරගත්තා. සුසර කරන එකට ඉංග්‍රීසියෙන් කියන්නෙ "ටියුන්" කරනවා කියලා. දැන් පැන් සින්දු වාදනය කරනවා. හරියට වයලින් එකක් බෝ එක නැත්තං අළුව නැතිව ඇඟිලිවලින් වාදනය කරනවා වගේ. තමන් ම තනියම ඒ මිහිර විඳිනව, බැරි බැරි ගානේ හරි.

"ශෝක සැනසුම් වේදනාවන්......."

පුදුම සහනයක්ලු හිතට දැනෙන්නෙ. කලුවරේ පැත්තකට වෙලා මේ අහිංසක සංගීත වාදනයෙන් හරියට හිතට විවේකයක් දැනෙනවලු.

"වයලින් එකක් බෝ එක නැත්තම් අළුව නැතිව වයන එකට බටහිර සංගීතයේ කියන්නේ පිෂිකාටෝ වාදනය" කියලා. ඉතින් මේ කරන්නෙත් ඒකයි මේ යුකුලෙලේ භාණ්ඩයෙන්." පැන්සල පින්සල එක්ක තමුන්ගේ සතුට බෙදා ගත්තා. පින්සලත් පැන්ගෙ කතාවට උනන්දුයි.

"යුකුලෙලේ කියන්නේ අපේ අයට වැඩිට නුපුරුදු වාදන භාණ්ඩයක්. ඒත් දැන් ඔය ඉලෙක්ට්‍රොනික් බඩු විකුණන්න තියෙන ප්‍රසිද්ධ කඩවල්වලත් යුකුලෙලේ විකුණන්න තියෙනවා. ඕනනන් ඩොලර් 25 ක් විතර වෙයි. කුඩා නිසා ඕනම තැනක

# යුකුලෙලේ



ගෙනියන්නත් පුළුවන්. අපි පොඩියට හිතුවට මේ භාණ්ඩයෙනුත් ලොකු දෙයක් කරන්න පුළුවන්. දැක්කද මං ෆේස් බුක් එකේ ෂෙයා කරපු යුකුලෙලේ වාදනය ? යුරෝපයේ රටවල යුකුලෙලේ වාදන උත්සව, තරඟ එහෙම තියෙනවා ඒ වගේ උත්සවයක දී සුරූපිනයක් කරපු වාදනයක වීඩියෝ එකක් තමයි මම ඒ ෂෙයාර් කළේ.

"අර " ලාලන යුකුලෙලේ" කියලා ෂෙයාර් කරපු එක වෙන්නැති ?" පින් ඒ දර්ශනය දැකලා. "දැක්කද දක්ෂකම ?" හිතාගන්නවත් බැරි තරමේ වාදනයක් ඒක.

"යුකුලෙලේ කොහේ භාණ්ඩයක් ද ?" පින් නිකමට වාගේ ඇහුවා.

"මුලින් ම හවායි රටේ තමයි යුකුලෙලේ තිබිලා තියෙන්නේ. මේ වචනයේ අදහස වෙන්නෙ " පොපියන ඇඟිලි" :Jumping Fle* කියන එක. මොකද වාදකයාගේ ඇඟිලි පොපියන හැටියට වෙන්න ඕන. "යුකු" (UKU) කියන එකේනම් අදහස් වෙන්නේ "තෑග්ග" කියලත් කියනවා."

"මේ භාණ්ඩය මුලින් ම නිපදවලා තියෙන්නේ 1880 කාලේ. හවායි දූපත්වල පදිංචි වෙලා හිටපු පෘතුගීසි සම්භවයක් තියෙන අයගේ නිර්මාණයක් කියලයි කියන්නෙ. 1960 ගණන්වල කැනඩාවේ ඉස්කෝලවලට හඳුන්වපා දීලා තියෙනවා ලාභදායක සංගීත භාණ්ඩයක් විදියට. ඒත් යුකුලෙලේ ජපානයට ගිහින් තියෙන්නේ 1929 විතර. 1961 දී විතර එක්සත් රාජධානියටත් මේ භාණ්ඩය අඳුනගන්න ලැබුණා. ජෝර්ජ් ෆෝම්බි (George Formby) කියන දක්ෂ යුකුලෙලේ වාදකයා නිසා. අද වෙනකොට මහා බ්‍රිතාන්‍යයේ යුකුලෙලේ සංගීත කණ්ඩායම් (Orchestra) පවා ඇති වෙලා තිනෙවා ජනප්‍රියකම නිසා."

"සාමාන්‍යයෙන් මේ භාණ්ඩ හදන්නේ ලීවලින්. මේ තරම් ලාභයට මේ භාණ්ඩය ගන්න පුළුවන් වෙන්නේ මේ හදන "ප්ලයි වුඩ්" ලීය (Plywood) ලාභ නිසා. ටිකක් ගාන වැඩි ලීයෙන්ම කපාපු යුකුලෙලේ හදන්න ගන්නේ මැහෝගනී ලීය. මට හිතෙන්නේ මේකත් එහෙම එකක්, මට ලාබෙට ඔපර්චුනිටි ෂොප් එකකින් හම්බ වුනාට. මොකද මේකෙ පිට පැත්ත ලීයෙන්ම හාරල, කපලයි තියෙන්නේ. මොනවා වුණත් සම්ප්‍රදායේ හැටියට හදන යුකුලෙලේ වලට ගන්න ලීය තමයි " කෝයා" (Koa) ලීය. එක එක හැඩයට යුකුලෙලේ හදනවා. එක එක ප්‍රමාණයටත් හදනවා."

"තත් හතරයි සාමාන්‍යයෙන් මේ යුකුලෙලේ භාණ්ඩයක තියෙන්නේ ඒත් සමහර ඒවයෙ තත් යුගල විදියට යොදලා තියෙන හින්දා හයක්, අටක් වෙන්න පුළුවන්.

මුලදි මේ තත් හදලා තියෙන්නේ "කැට් ගට්" (Catgut) වලින්ලු. දැන්නම් ඉතින් හදන්නෙ නයිලෝන් පොලිමර්වලින්."

"සාමාන්‍ය ප්‍රමාණයේ යුකුලෙලේවලට කියන්නේ සුප්‍රානෝ (Soprano) යුකුලෙලේ :Uklele) කියලා. ප්‍රසංගවලට ගන්න ඊට වඩා ටිකක් ලොකු "එන්හෑන්ස්ඩ් සුප්‍රානෝ" භාණ්ඩත් හැදුවා. ගැඹුරු සද්දයකුයි තියෙන්නෙ. සද්දෙත් වැඩියි. ඊට පස්සෙ"ටෙනර්" (Tenor) කියන ප්‍රමාණයේ භාණ්ඩත් එකතු වුණා. 1940 ගණන් වෙනකොට බැරිටෝන් (Baritone), "කොන්ට්‍රාබාස්" (Contrabass)" "බාස්" (Bass) වාගේ ලොකු ප්‍රමාණවලටත් යුකුලෙලේ භාණ්ඩය වැඩිදියුණු කළා." ප්‍රමාණයෙන් ලොකු වෙනකොට හඩ ගැඹුරුයි. සද්දෙයි."

"පැන් සෑහෙන්න යමක් හොයලා තියෙනවා වාගෙ. කොහෙන් ද ඔය විස්තර ? ඉන්ටර්නෙට් එකෙන් වෙන්නැති...."

"ඔව් "විකිපිඩියා" වලට ගියාම තවත් විස්තර කියවන්න පුළුවන්."

"ඇත්තට ම මේ වාගේ සංගීත භාණ්ඩ අපේ වැඩවලට යොදා ගන්නෙ නැත්තෙ ඇයි ?"

"ඒකට හොඳම උත්තරයක් අර මහීෂා දුව දුන්නේ. ඇයි අපට බැරි ?"

බැරිම නෑ. එහෙම අපට නො හුරු භාණ්ඩ අපේ සින්දුවලට යොදාගත්ත අය ඉන්නවා. බැංජෝ මැණ්ඩලීනය පහුගිය කාලේ හරියට අහන්න ලැබුණා. ජන නාද රටාවලින් ගීත නිර්මාණය කරපු ලයනල් රන්වල මහත්තමයා පවා ඒ භාණ්ඩය යොදා ගත්තා. "ඕබෝ", "කොරැංගිලියා", "තාර් ෆැනායි", "ෂටම්", " ජූස් හාෆ්" වාගෙ භණ්ඩ වික්ටර් රත්නායක මහත්තයාගේ ගීතවලට ඒ මහත්තයා යොදාගෙන තියෙනවා. රෝහණ වීරසිංහ මහත්තයා "සන්තූර්" එක වාදනය කරන්න දක්ෂයෙක් විදියටයි අපි මුලින්ම දන්නේ. ෂෙල්ටන් ප්‍රේමරත්න මහත්තයා සංගීත භාණ්ඩ තමන්ම හදාගෙන සිංදුවලට වාදනය කළා. අමරදේවතුමාගේ ගායනාවලදිත් එතුමා අතේ තිබුනේ එතමා ම නිර්මාණය කරගත්ත භාණ්ඩයක්ලු." පැන් දිගටම කියාගෙන ගියා.

"වෙන ම කතා කරන්න වටින මාතෘකාවක් මේක." පින්ට ඉබේට ම කියවුණා.

ශ්‍රී ලාංකික වෙළඳසළ විකිණීමට

මෙල්බන් උතුරු ප්‍රදේශයේ
වසර දොළහකට වැඩි කාලයක්
සාර්ථක ලෙස පවත්වාගෙන යන
විශාල කීර්තිනාමයක් හිමි
ශ්‍රී ලාංකික වෙළඳසල
විකිණීමට ඇත

නිර්ව්‍යාජ ගැණුම්කරුවන් පමණක් විමසන්න
0430 246 884